JMC vLearning
"your virtual learning partner"

# SLFRS 16 - කල්බදු

JMC ජයසේකර කළමනාකරණ මධ්‍යස්ථානය JAYASEKERA MANAGEMENT CENTRE (PVT) LTD Estd. 1972
JMC Jayasekera Management Centre (Pvt) Ltd
Pioneers in Professional Education
65/2A, Chittampalam Gardiner Mawatha, Colombo 02 | T: +94 112 430451 | E: info@jmc.lk | F: +94 115 377917



මේ ඉන්නේ කවිඳු

කවිඳුට කාරෙකක් ඕනි

කවිඳු බලන කාරෙක එක රු. මිලියන 20යි

හැබැයි කවිඳු අතේ තියෙන්නේ රු මිලියන 5ක් විතරයි



Sandeepa Jayasekera - JMC 3

3

JMC vLearning "your virtual learning partner"



කවිඳුට කාරෙක ගන්න විදි 03ක් තිබ්බා

- ඉතුරු කරලා
  - ඉතුරු කරලා කාරෙක ගන්න සෑහෙන කාලයක් යයි
- ණයක් අරන්
  - ඉතුරු කරන තරම් කාලෙ ගියේ නැතත් බැංකු ණය ටිකක් කල් යනවා, ඇපකාරයෝ හොයන්නයි, එක එක ලියවිලි දෙන්නයි වගේ කරදර වැඩියි
- කල්බද්දට
  - කල්බද්දට ගන්න එක නම් ඉක්මන්, ලියවිලිත් අඩුයි

Sandeepa Jayaseke 4

4



කවිඳු LB Finance එකට ගිහින්
කාරෙක කල්බදු පහසුකමක් ඉල්ලුවා

LB Finance එක කිව්වා ඉතිරි
රු මිලියන 15 එයාල වාහන සේල්
එකට දෙන්නම් කියලා
හැබැයි අවුරුදු 5කින් රු මිලියන 15
ගෙවන්න කිව්වා 10%ක පොළියකුත්
එක්ක



බලන් ගියාම මේකත් ණයක් නේ
සල්ලි වලින් දෙන් නැතුව වාහනේට ගෙවපු



5



ඒ නිසා අවුරුදු 05 යනකන් වාහනේ
අයිතිය LB Finance එකේ නමට
තියෙන්න ඕනි කිව්වා
අයිතිය LB Finance එකට තිබ්බට
කවිඳුට පාවිච්චි කරන්න පුළුවන්
හැබැයි කවිඳු ගෙව්වේ නැති වුණොත්
LB Finance එකෙන් ඇවිත් එයාලා
ගාව තියන යතුර පාවිච්චි කරලා
වාහනේ උස්සනවා



ඔක්කොම ගෙවලා ඉවර වුණාම කවිඳුගේ නමට වාහනේ හරවා ගන්න
පුළුවන්
කවිඳු කැමති වෙලා වාහනේ ගත්තා



6

JMC vLearning
your virtual learning partner

කවිඳු අවුරුදු 05 ඉවර වෙද්දි රු මිලියන 20ක් ගෙවලා තිබ්බා

වැඩිපුර ගෙවලා තිබ්බ රු මිලියන 05 කල්බදු පොළිය



ගිවිසුමේ හැටියට ඔක්කොම ගෙව්වට පස්සේ කවිඳුට කාරෙකේ අයිතියත් ආවා



7

LB Finance එක කාරෙක භාවිතා කරන්න තියන අයිතිය දුන්නා කවිඳුට



වසර 05ක ගිවිසුමක්



| LB Finance |
|---|
| කාරෙකේ අයිතිකාරයා |
| කල්බදු දීමනාකරු |

කවිඳු ඒ වෙනුවෙන් කල්බදු වාරික ගෙව්වා

| කවිඳු |
|---|
| කාරෙක පාවිච්චි කරන කෙනා |
| කල්බදු ගැණුම්කරු |



8

JMC vLearning "your virtual learning partner"



මේ ඉන්නේ විජිනි

එයා මේ දවස් වල ගෙයක් කුළියට ගන්න හොයනවා





මේ ඉන්නේ ශළින

එයා මේ ගෙදර කුළියට දෙන්න ඉන්නේ






JMC vLearning "your virtual learning partner"




ශළින කැමති වෙනවා ගෙදර විජිනිට කුළියට දෙන්න

ශළිනයි විජිනියි ගෙවල් කුළී ගිවිසුමක් අත්සන් කරනවා!




ශළින ගෙදර භාවිතා කරන
අයිතිය දෙනවා විජිනිට
කුළී ගිවිසුම අවුරුදු 05යි
විජිනි ඒ වෙනුවෙන් ගෙවල්
කුළී ගෙවනවා
ශළින
ගෙදර අයිතිකාරයා
කුළී දීමනාකරු
විජිනි
කුළියට ගත්ත කෙනා
කුළී ගැනුම්කරු
Sandeepa Jayasekera - JMC

11



කල්බදු
වත්කමේ භාවිතය
පාලනය
කිරීමේ අයිතිය
කල්බදු දීමනාකරු
වත්කමක් කුළියට දීම
කල්බදු ගැනුම්කරු
ප්‍රතිශ්ඨාව
(කල්බදු වාරික)
වත්කමේ අයිතිකරු
කුළියට දුන් පාර්ශවය
පාරිභෝගිකයා
කුළියට ගත් පාර්ශවය

12

# කල්බදු ගිණුම්කරණය
# පියවර 01
# ගිවිසුමක් තුල කල්බද්දක් ඇතුලත් වේ දැයි හඳුනාගැනීම

13

## ගිවිසුමක් තුල කල්බද්දක් ඇතුලත් වේ දැයි හඳුනාගැනීම





14

JMC vLearning
your virtual learning partner

## කල්බදු ගිණුම්කරණය
## පියවර 02
## නිදහස්වීම් -
## කල්බදු ගිණුම්කරණය නොකර සිටිය හැකි අවස්ථා

15




16

JMC vLearning
"your virtual learning partner"

උපද කල්බදු කරනවා කියන්නේ?

17

17

ප්‍රශ්න 01

නාමල් සමාගම 20X1/01/01 ණයා පිටපත් යන්ත්‍රයක් මාස 08 කාලයක් සඳහා කල්බදු පදනමක් යටතේ ලබා ගන්නා ලදී.

සමස්ත කල්බදු වියදම රු.80,000 ක් වූ අතර ඒ ගිවිසුමට එළඹුණු දිනයේදීම ගෙවා නිම කරන ලදී.

ගිණුම් වර්ෂය 20X1/03/31 අවසන් වන්නේ නම් ගිණුම් සටහන් දක්වන්න.

18

18

JMC vLearning
"your virtual learning partner"

### ඉදිරියට කළ කල්බදු වියදම

### මුදල් ගිණුම

### කල්බදු වියදම් ගිණුම





## ප්‍රශ්න 02

ඩිල්කි සමාගමේ කල්බදු ගිවිසුම් යටතේ පහත වත්කම් ලබාගෙන ඇත

ඒ අතුරින් අඩු වටිනාකම් කල්බදු හඳුනාගන්න.

| වත්කම | අඩු වටිනාකම් කල්බද්දක්ද? |
| --- | --- |
| මෝටර් රථය | |
| කාර්යාල ගොඩනැගිල්ල | |
| කාර්යාල පරිගණකය | |
| තවත් ආයතනයකට උපකල්බදු කර ඇති ඡායා පිටපත් මුද්‍රණ යන්ත්‍රය | |
| ජංගම දුරකථනය | |





JMC vLearning "your virtual learning partner"

## කල්බදු ගිණුම්කරණය
## පියවර 03
## කල්බදු ගැනුම්කරුගේ පොත් වල ගිණුම් තැබීම

21

## දිගුකාලීන ණයක් යටතේ වත්කමක් අත්පත් කරගැනීමකට සමාන වේ

කල්බදු වගකීම ← → වත්කම භාවිත අයිතිය

22

# කල්බදු වගකීම යනු

කල්බදු ණයහිමියාට

ගෙවීමට බැඳී ඇති අගයේ

වර්තමාන වටිනාකම

“බාැචි ජ්හීැනැර් - නඑක 23

23

# මුදලේ කාල අගය තේරුම් ගමු

රු 100/-ක් අද ලැබෙනවාටද අවුරුද්දකට පසුව ලැබෙනවාටද ඔබ කැමති?

අද ලැබෙනවාට ඔබ කැමති!

හේතු

1. අද එය ලැබුනොත් ඔබට එය ආයෝජනය කර ආදායමක් උපයා ගත හැකිය
2. අද රු 100/- කින් ගත හැකි භාණ්ඩ හා සේවා එම මිලටම අවුරුද්දකට පසුව මිලදී ගත නොහැකිය
3. අද මුදල ලැබුනොත් එය නිශ්චිතය. අවුරුද්දකට පසුව මුදල ලැබීම අවිනිශ්චිතය

24

JMC vLearning
"your virtual learning partner"

එසේ නම් යම් මුදලක් අනාගතයේ ලැබෙන්නේ නම්

අහිමි වන ආයෝජන ආදායමට - ආවස්ථික පිරිවැය

මූර්ත අගය පහල යැමට - උද්ධමනය

අවිනිශ්චිතතාවට

වන්දියක් ලෙස පොළියක් බලාපොරොත්තු වේ

වර්තමාන මුදල් ප්‍රවාහ + පොළිය = අනාගත මුදල් ප්‍රවාහ

25

අනාගත මුදල් ප්‍රවාහ තුල ඇතුළත් පොළිය ඉවත් කිරීම වට්ටම් කිරීම ලෙස හඳුන්වයි

අනාගත මුදල් ප්‍රවාහය × වට්ටම් සාධකය = වර්තමාන මුදල් ප්‍රවාහය

වට්ටම් සාධකය $= \frac{1}{1 + r \wedge n}$

r = පොළී අනුපාතය

n = කාලය

26

JMC vLearning your virtual learning partner

# ප්‍රශ්න 03

පහත මුදල් ප්‍රවාහයන්ගේ වර්තමාන අගයන් ගණනය කරන්න

(පොළී අනුපාතය 10% යැයි උපකල්පනය කරන්න)

| වසර | අනාගත මුදල් ප්‍රවාහය | වට්ටම් සාධකය | වර්තමාන අගය | පොළිය |
|---|---|---|---|---|
| | A | B | C = A*B | D = A - C |
| 0 | 100 | 1 | | |
| 1 | 110 | 0.91 | | |
| 2 | 121 | 0.83 | | |
| 3 | 133 | 0.75 | | |

27

27

# කල්බදු වගකීම මූලික මිණුම්කරණය

- ස්ථාවර ගෙවීම්
- විචල්‍ය ගෙවීම්
- සහතික කළ අවශේෂ මිල
- කලින් අවසන් කරන විකල්පයක් තිබේ නම් එහි මිල
- ගිවිසුම කලින් අවසන් කරන විට දඩ මුදලක් අය කරන්නේ නම් එය

28

28

JMC vLearning
"your virtual learning partner"

## කල්බදු වගකීම පසුකාලීන මිණුම්කරණය

ආරම්භක කල්බදු වගකීම + කල්බදු පොළිය − වාරික ගෙවීම් = අවසාන කල්බදු වගකීම

කල්බදු පොළිය = කල්බදු පොළී අනුපාතය × කාලච්ඡේදය ආරම්භයේ කල්බදු වගකීම් ශේෂය

29

29

## වත්කම භාවිත අයිතිය යනු


- කල්බදු කාලය තුල
- වත්කම පාලනය කිරීමට
- කල්බදු ගැනුම්කරුට ලැබෙන
- අයිතිය

Sandeepa Jayasekera - JMC


30

30

JMC vLearning your virtual learning partner




31




32

JMC vLearning
your virtual learning partner

## වත්කම භාවිත අයිතිය පසුකාලීන මිණුම්කරණය

| පිරිවැය ආකෘතිය | |
|---|---|
| පිරිවැය | XX |
| (-) සමුච්චිත ක්ෂය | (X) |
| (-) සමුච්චිත හානිකරණ අලාභ | (X) |
| ශුද්ධ පොත් අගය | XX |

| ප්‍රත්‍යාගණන ආකෘතිය | |
|---|---|
| ප්‍රත්‍යාගනිත අගය | XX |
| (-) පසුකාලීන සමු. ක්ෂය | (X) |
| (-) පසුකාලීන සමු. හානිකරණ අලාභ | (X) |
| ශුද්ධ පොත් අගය | XX |

33

33

## කල්බදු ගැණුම්කරුගේ පොත්වල ගිණුම් තැබීම

| විස්තරය | ද්විත්ව සටහන |
|---|---|
| **මූලික ගෙවීම** | |
| වත්කම භාවිත අයිතිය ගිණුම | හර |
| මුදල් ගිණුම | බැර |
| | |
| **කල්බදු වගකීම ලෙස හඳුනාගත් අගය** | |
| වත්කම භාවිත අයිතිය ගිණුම | හර |
| කල්බදු වගකීම් ගිණුම | බැර |

34

| කල්බදු ගැණුම්කරුගේ පොත්වල ගිණුම් තැබීම | |
|---|---|
| විස්තරය | ද්විත්ව සටහන |
| **ආරම්භක සෘජු පිරිවැය ලෙස කරන ගෙවීම** | |
| වත්කම භාවිත අයිතිය ගිණුම | හර |
| මුදල් ගිණුම | බැර |
| | |
| **වාර්ෂික පොලිය** | |
| පොලී වියදම් ගිණුම | හර |
| කල්බදු වගකීම් ගිණුම | බැර |

35

| කල්බදු ගැණුම්කරුගේ පොත්වල ගිණුම් තැබීම | |
|---|---|
| විස්තරය | ද්විත්ව සටහන |
| **කල් බදු වාරික ගෙවීම** | |
| කල්බදු වගකීම් ගිණුම | හර |
| මුදල් ගිණුම | බැර |
| | |
| **වත්කමේ ක්ෂය වීම** | |
| වත්කම භාවිත අයිතිය ගිණුම ක්ෂයවීම් ගිණුම | හර |
| වත්කම භාවිත අයිතිය ගිණුම සමුච්චිත ක්ෂය ගිණුම | බැර |

36

JMC vLearning "your virtual learning partner"

## මූල්‍ය තත්ව ප්‍රකාශය තුල ඉදිරිපත්කිරීම

වත්කම භාවිත අයිතිය → ජංගම නොවන වත්කම

කල්බදු වගකීම

ජංගම වගකීම

ඊළඟ වාරිකයේ ඇතුලේ තියන ප්‍රාග්ධන කොටස

ඊළඟ වාරිකය — ඊළඟ වාරිකය ඇතුලේ තියන පොළිය

ජංගම නොවන වගකීම

ඊළඟ අවුරුද්දට පස්සේ ගෙවන්න තියන ප්‍රාග්ධන කොටස

මුළු කල්බදු වගකීම — ජංගම කොටස

37

37

## ලාභලාභ ගිණුම තුල ඉදිරිපත් කිරීම

ක්ෂය

කල්බදු පොළිය

“බාැච් ඡ්හීැනැර් - නඑක

38

38

JMC vLearning
“your virtual learning partner”

## ප්‍රශ්න 04

සීමා සහිත පීපල්ස් ලීසිං සමාගමෙන් 20X7.04.01 දින සීමිත දිනපාල සමාගම කල්බදු ගිවිසුමක් යටතේ යන්ත්‍රයක් ලබා ගත්තේය. එම ගිවිසුමට අනුව,

| | | |
|---|---|---|
| කල්බදු කාලසීමාව | - | වසර 5 කි |
| මූලික තැන්පතුව | - | රු: 200,000 |

ඉතිරි මුදල වාර්ෂික වාරිකයක් රු: 600,000 බැගින් වාරික 5 කින් ගෙවිය යුතුය. වාරික සෑම වර්ෂයකම අගදී ගෙවිය යුතුය. එලදායී ජීවිත කාලයද අවුරුදු 5 ක් වේ. නොගෙවූ කල්බදු ගෙවීමෙහි වර්තමාන අගය රු. 1,800,000 ක් විය.

| | | |
|---|---|---|
| පොළී අනුපාතය | - | 20% |

පළමු වාරිකය තුළ ඇතුළත් පොළිය රු.360,000 ක් වන අතර, දෙවන වාරිකය තුළ ඇතුළත් පොළිය රු.312,000 ක් වේ. කල්බදු කාලය අවසානයේ වත්කමේ අයිතිය පැවරෙන්නේ නැත

**ඔබ විසින්,**

20X8.03.31 දිනෙන් අවසන් වසරෙහි ගිණුම් සටහන් හා එදිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශය පෙන්වන්න.

39

39

## පිළිතුරු 04

ලබා දී තිබෙන තොරතුරු අවබෝධ කරගමු

| වසර | මූලික ගෙවීම | කල්බදු වාරික | පොළිය 20% | ණය කොටස |
|---|---|---|---|---|
| 0 | 200,000 | | 0 | |
| 1 | | 600,000 | 360,000 | 240,000 |
| 2 | | 600,000 | 312,000 | 288,000 |
| 3 | | 600,000 | | |
| 4 | | 600,000 | | |
| 5 | | 600,000 | | |
| එකතුව | 200,000 | 3,000,000 | 1,200,000 | 1,800,000 |

40

40

## ද්විත්ව සටහන්

| විස්තරය | හර | බැර |
|---|---|---|
| මූලික ගෙවීම | | |
| වත්කම භාවිත අයිතිය | 200,000 | |
| මුදල් | | 200,000 |
| කල්බදු වගකීම (ණය ප්‍රාග්ධන කොටස) | | |
| වත්කම භාවිත අයිතිය | 1,800,000 | |
| කල්බදු වගකීම | | 1,800,000 |
| පළමු වාරිකය තුල ඇතුළත් පොළිය | | |
| කල්බදු පොළිය | 360,000 | |
| කල්බදු වගකීම | | 360,000 |

41

## ද්විත්ව සටහන්

| විස්තරය | හර | බැර |
|---|---|---|
| පළමු කල්බදු වාරිකය ගෙවීම | | |
| කල්බදු වගකීම | 600,000 | |
| මුදල් | | 600,000 |
| පළමු වර්ෂයේ ක්ෂය | | |
| ක්ෂය | 400,000 | |
| ක්ෂය වෙන්කිරීම | | 400,000 |

42

JMC vLearning
"your virtual learning partner"

# ක්ෂය ගණනය කිරීම

ක්ෂය = (ක්ෂය කළ හැකි අගය/ඵලදායී ජීව කාලය)

ක්ෂය = [(පිරිවැය - සුන්බුන් අගය)/ඵලදායී ජීව කාලය]

ක්ෂය = [(2,000,000 - 0)/5]

ක්ෂය = 400,000

43

වත්කම භාවිත අයිතිය

| | |
|---|---|
| | |

මුදල්

| | |
|---|---|
| | |

කල්බදු වගකීම

| | |
|---|---|
| | |



44

JMC vLearning
"your virtual learning partner"

### කල්බදු පොළිය

### ක්ෂය

### ක්ෂය වෙන්කිරීම

“බෑැචි ජ්හීැනැර් - නඑක 45

45

## ඉදිරිපත් කිරීම

| | |
|---|---|
| මූලය තත්ව ප්‍රකාශ උද්ධෘතය | රු |
| **ජංගම නොවන වත්කම්** | |
| වත්කම භාවිත අයිතිය | |
| | |
| **ජංගම නොවන වගකීම්** | |
| කල්බදු වගකීම | |
| | |
| **ජංගම වගකීම්** | |
| කල්බදු වගකීම | |

46

## ඉදිරිපත් කිරීම

| ලාභාලාභ සහ වෙනත් විස්තීර්ණ ආදායම් ප්‍රකාශ උද්ධෘතය | රු |
|---|---|
| ක්ෂය | |
| කල්බදු පොළිය | |

47

## ප්‍රශ්න 05

සීමිත ලකීලෑන්ඩ් සමාගම නිෂ්පාදන යන්ත්‍රයක් කල්බදු ගිවිසුමක් යටතේ සීමිත පිපල්ස් ලීසිං සමාගම හරහා 20X1.04.01 දින අත්පත් කරගත් අතර නොගෙවූ කල්බදු ගෙවීමෙහි වර්තමාන අගය රු.1000,000ක් විය. කල්බදු ගිවිසුමට අනුව 20X1.04.01 දින රු.100,000 ගෙවිය යුතුයි. ඉතිරිය වාරිකයක් රු.400,000 ක් බැගින් වු වාර්ෂික වාරික 3 කින් ගෙවා නිම කළ යුතුයි. වාරික ගෙවීම සෑම වසරකම අග දින සිදුකළ යුතු අතර වාරික මත පොළිය ආරම්භක ණය අගය මත පදනම්ව වාර්ෂිකව 10% බැගින් විය

20X1.04.01 දින යන්ත්‍රය ප්‍රවාහනය සහ සවි කිරීම සඳහා රු.100,000/-ක වියදමක් දරන ලදි

කල්බදු කාලය අවසානයේ වත්කමේ අයිතිය පැවරෙන්නේ නැත

යන්ත්‍රයේ ඵලදායී ජිවිත කාලය වර්ෂ 4 කි.

**ඔබ විසින්,**

සීමිත ලකීලෑන්ඩ් සමාගමේ 20X1/20X2 වර්ෂයට අදාළ ගිණුම් සටහන් හා 20X2.03.31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ උදෘතයක් පෙන්වන්න.

48

48

IMC vLearning "your virtual learning partner"

# පිළිතුරු 05

ලබා දී තිබෙන තොරතුරු අවබෝධ කරගමු

| වසර | මූලික ගෙවීම | කල්බදු වාරික | පොළිය 10% | ණය ප්‍රාග්ධන කොටස |
|---|---|---|---|---|
| 0 | 100,000 | | | |
| 1 | | 400,000 | 1,000,000X10%<br>100,000 | 400,000-100,000<br>300,000 |
| 2 | | 400,000 | (1,000,000-300,000)X10%<br>70,000 | 400,000-70,000<br>330,000 |
| 3 | | 400,000 | | |
| එකතුව | 100,000 | 1,200,000 | 200,000 | 1,000,000 |

49

## ද්විත්ව සටහන්

| විස්තරය | හර | බැර |
|---|---|---|
| මූලික ගෙවීම | | |
| වත්කම භාවිත අයිතිය | 100,000 | |
| මුදල් | | 100,000 |
| ආරම්භක සෘජු වියදම් | | |
| වත්කම භාවිත අයිතිය | 100,000 | |
| මුදල් | | 100,000 |
| කල්බදු වගකීම (ණය ප්‍රාග්ධන කොටස) | | |
| වත්කම භාවිත අයිතිය | 1,000,000 | |
| කල්බදු වගකීම | | 1,000,000 |

50

JMC vLearning "your virtual learning partner"

## ද්විත්ව සටහන්

| විස්තරය | හර | බැර |
|---|---|---|
| පළමු වාරිකය තුල ඇතුළත් පොළිය | | |
| කල්බදු පොළිය | 100,000 | |
| කල්බදු වගකීම | | 100,000 |
| පළමු කල්බදු වාරිකය ගෙවීම | | |
| කල්බදු වගකීම | 400,000 | |
| මුදල් | | 400,000 |
| පළමු වර්ෂයේ ක්ෂය | | |
| ක්ෂය | 400,000 | |
| ක්ෂය වෙන්කිරීම | | 400,000 |

51

## ක්ෂය ගණනය කිරීම

ගිවිසුම අවසානයේ වත්කමේ අයිතිය පැවරෙන්නේ නැත ඒ අනුව වත්කමේ ඵලදායී ජීව කාලය වන අවුරුදු 04 සහ කල්බදු කාලය වන අවුරුදු 03 යන දෙකෙන් අඩු අගය වන කල්බදු කාලයට ක්ෂය කරන ලදි

ක්ෂය = (ක්ෂය කළ හැකි අගය/කල්බදු කාලය)

ක්ෂය = [(පිරිවැය - සුන්බුන් අගය)/කල්බදු කාලය]

ක්ෂය = [(1,200,000 - 0)/3]

ක්ෂය = 400,000

52

## වත්කම භාවිත අයිතිය

## මුදල්

## කල්බදු වගකීම



53

## කල්බදු පොළිය

## ක්ෂය

## ක්ෂය වෙන්කිරීම



54

JMC vLearning "your virtual learning partner"

**ඉදිරිපත් කිරීම**

| | |
|---|---|
| මූල්‍ය තත්ව ප්‍රකාශ උද්ධෘතය | රු |
| **ජංගම නොවන වත්කම්** | |
| වත්කම භාවිත අයිතිය | |
| | |
| **ජංගම නොවන වගකීම්** | |
| කල්බදු වගකීම | |
| | |
| **ජංගම වගකීම්** | |
| කල්බදු වගකීම | |

55

**ඉදිරිපත් කිරීම**

| | |
|---|---|
| ලාභාලාභ සහ වෙනත් විස්තීර්ණ ආදායම් ප්‍රකාශ උද්ධෘතය | රු |
| ක්ෂය | |
| කල්බදු පොළිය | |

56

JMC vLearning "your virtual learning partner"

**ප්‍රශ්න 06**

සීමාසහිත කේසර සමාගම විසින් කල්බදු පදනමක් යටතේ යන්ත්‍රයක් ලබාගන්නා ලදි 20X1.04.01 දින මූලික ගෙවීමක් ලෙස රු 200,000/-ක් ගෙවන ලදි ඉතිරිය රු 400,000/- බැගින් වන වාරික 03 කින් ගෙවීමට එකඟ විය පොළී අනුපාතය 10%කි.

වට්ටම් සාධක පහත පරිදි වේ

01 වසර 0.91

02 වසර 0.83

03 වසර 0.76

යන්ත්‍රයේ ඵලදායී ජීව කාලය අවුරුදු 2ක් වේ. ගිවිසුම අවසානයේ යන්ත්‍රයේ අයිතිය මාරු නොවේ. සමාගම විසින් යන්ත්‍රය සඳහා ප්‍රත්‍යාගණන ආකෘතිය භාවිතා කරයි. 20X2.03.31 දිනට යන්ත්‍රය ප්‍රත්‍යාගණන කරන ලද අතර ප්‍රත්‍යාගණන වටිනාකම රු.800,000/-ක් විය.

ඔබ විසින් ඉහත ගනුදෙනුව 20X2/03/31 දිනට මූල්‍ය තත්ව ප්‍රකාශය තුල සහ 20X1/X2 වර්ෂයේ ලාභාලාභ ගිණුම තුල නිරූපණය කළ යුතු ආකාරය දක්වන්න 57

57

# පිළිතුරු 06

## නොගෙවූ කල්බදු ගෙවීමේ වර්තමාන අගය ගණනය කරමු

| වසර | අනාගත මුදල් ප්‍රවාහ | වට්ටම් සාධකය | වර්තමාන අගය |
|---|---|---|---|
| 1 | 400,000 | 0.91 | 364,000 |
| 2 | 400,000 | 0.83 | 332,000 |
| 3 | 400,000 | 0.75 | 304,000 |
| **එකතුව** | 1,200,000 | | 1,000,000 |

58

58

# පිළිතුරු 06

## ලබා දී තිබෙන තොරතුරු අවබෝධ කරගමු

| වසර | මූලික ගෙවීම | කල්බදු වාරික | පොළිය 10% | ණය කොටස |
|---|---|---|---|---|
| 0 | 200,000 | | | |
| 1 | | 400,000 | 1,000,000X10%<br>100,000 | 400,000-100,000<br>300,000 |
| 2 | | 400,000 | (1,000,000-300,000)X10%<br>70,000 | 400,000-70,000<br>330,000 |
| 3 | | 400,000 | | |
| එකතුව | 200,000 | 1,200,000 | 200,000 | 1,000,000 |

59

59

# ද්විත්ව සටහන්

| විස්තරය | හර | බැර |
|---|---|---|
| මූලික ගෙවීම | | |
| වත්කම භාවිත අයිතිය | 200,000 | |
| මුදල් | | 200,000 |
| කල්බදු වගකීම (ණය ප්‍රාග්ධන කොටස) | | |
| වත්කම භාවිත අයිතිය | 1,000,000 | |
| කල්බදු වගකීම | | 1,000,000 |
| පළමු වාරිකය තුල ඇතුළත් පොළිය | | |
| කල්බදු පොළිය | 100,000 | |
| කල්බදු වගකීම | | 100,000 |

60

JMC vLearning "your virtual learning partner"

## ද්විත්ව සටහන්

| විස්තරය | හර | බැර |
|---|---|---|
| පළමු කල්බදු වාරිකය ගෙවීම | | |
| කල්බදු වගකීම | 400,000 | |
| මුදල් | | 400,000 |
| පළමු වර්ෂයේ ක්ෂය | | |
| ක්ෂය | 600,000 | |
| ක්ෂය වෙන්කිරීම | | 600,000 |
| ප්‍රත්‍යාගණිත වත්කමේ සමුච්චිත ක්ෂය වත්කම් ගිණුමට මාරු කිරීම | | |
| ක්ෂය වෙන්කිරීම | 600,000 | |
| වත්කම භාවිතා කිරීමේ අයිතිය | | 600,000 |

61

## ද්විත්ව සටහන්

| විස්තරය | හර | බැර |
|---|---|---|
| ප්‍රත්‍යාගණන ලාභය ගිණුම්ගත කිරීම | | |
| වත්කම භාවිතා කිරීමේ අයිතිය | 200,000 | |
| ප්‍රත්‍යාගණන සංචිත ගිණුම (වෙනත් විස්තීර්ණ ආදායම් හරහා) | | 200,000 |

62

JMC vLearning your virtual learning partner

## ක්ෂය ගණනය කිරීම

ගිවිසුම අවසානයේ වත්කමේ අයිතිය පැවරෙන්නේ නැත ඒ අනුව වත්කමේ ඵලදායී ජීව කාලය වන අවුරුදු 02 සහ කල්බදු කාලය වන අවුරුදු 03 යන දෙකෙන් අඩු අගය වන ඵලදායී ජීව කාලයට ක්ෂය කරන ලදි

ක්ෂය = (ක්ෂය කළ හැකි අගය/ ඵලදායී ජීව කාලය)

ක්ෂය = [(පිරිවැය - සුන්බුන් අගය)/ ඵලදායී ජීව කාලය]

ක්ෂය = [(1,200,000 - 0)/2]

ක්ෂය = 600,000

63

## ප්‍රත්‍යාගණන ලාභය හෝ අලාභය ගණනය කිරීම

| | | |
|---|---|---|
| ප්‍රත්‍යාගණන අගය | | 800,000 |
| (-) 20X2 03 31 දිනට වත්කමේ ධාරණ අගය | | |
| වත්කම භාවිතා කිරීමේ අයිතිය පිරිවැය | 1,200,000 | |
| (-) සමුච්චිත ක්ෂය | (600,000) | (600,000) |
| ප්‍රත්‍යාගණන ලාභය | | 200,000 |

ප්‍රත්‍යාගණන ලාභය ගිණුම්ගත කිරීම

මෙම වත්කමට අදාළව පෙර වර්ෂයක ප්‍රත්‍යාගණන අලාභ නොමැති බැවින් සමස්ත ලාභය වෙනත් විස්තීර්ණ ආදායම් ප්‍රකාශය හරහා ප්‍රත්‍යාගණන සංචිතය තුල හ÷නාගත යුතුය

64

JMC vLearning
"your virtual learning partner"

## වත්කම භාවිත අයිතිය

## මුදල්

## කල්බදු වගකීම



## කල්බදු පොළිය

## ක්ෂය

## ක්ෂය වෙන්කිරීම

## ප්‍රත්‍යාගණන සංචිතය






## ඉදිරිපත් කිරීම

| මූලය තත්ව ප්‍රකාශ උද්ධෘතය | රු |
|---|---|
| **ජංගම නොවන වත්කම්** | |
| වත්කම භාවිත අයිතිය | |
| | |
| **හිමිකම්** | |
| ප්‍රත්‍යාගණන සංචිතය | |
| | |
| **ජංගම නොවන වගකීම්** | |
| කල්බදු වගකීම | |
| | |
| **ජංගම වගකීම්** | |
| කල්බදු වගකීම | |

## ඉදිරිපත් කිරීම

| ලාභාලාභ සහ වෙනත් විස්තීර්ණ ආදායම් ප්‍රකාශ උද්ධෘතය | රු |
|---|---|
| ලාභාලාභ ගිණුම | |
| ක්ෂය | |
| කල්බදු පොළිය | |
| | |
| වෙනත් විස්තීර්ණ ආදායම් ප්‍රකාශය | |
| ප්‍රත්‍යාගණන ලාභය | |

69




70

70

JMC vLearning "your virtual learning partner"

FARPack09

1

Sandeepa Jayasekera - JMC

# AAT තෙවෙනි අදියර මූල්‍ය වාර්තාකරණය

Sandeepa Jayasekera

B.Sc. (Acct.) Hons. Gold Medal Winner, ACA, SAT, ACMA (UK), CGMA (UK), CA Prize Winner for AFR subject in Strategic Level II, CA First in Order of Merit Prize Winner in CAB II Level, CIMA Strategic Level Aggregate Prize Winner, Reading for MBA (PIM-SJP).

1

# SLFRS 16 - කල්බදු දෙවන කොටස
# SLFRS 16 – Leases Part 02




2

# කල්බදු දීමනාකරුගේ පැත්තෙන් ගිණුම තැබීම

3

කල්බදු දීමනාකරුගේ පැත්තෙදී කල්බදු වර්ග දෙකකට වෙන් කෙරේ




4

JMC vLearning "your virtual learning partner"

## මොනවාද මේ අවදානම් සහ ප්‍රතිලාභ?

| අවදානම් | ප්‍රතිලාභ |
|---|---|
| • ඉල්ලුමේ අඩුවෙලා එන අලාභ<br>• තාක්ෂණික යල්පැනීම්<br>• නඩත්තු අඵත්වැඩියා<br>• වත්කම මත ගෙවන බදු | • වත්කම පාවිච්චි කරලා උපයන ලාභ<br>• වත්කම විකුණලා උපයන ලාභ<br>• වත්කමේ අනාගත වෙළඳපොල මිල ඉහළ යාම<br>• බදු ප්‍රතිලාභ |

5

# මූල්‍ය කල්බද්ද මෙහෙයුම් කල්බදු ද කියලා වර්ගීකරණය

6




7

# මෙහෙයුම් කල්බදු ගිණුම් තැබීම

**කල්බදු මුදල් ලැබීම් අදාල ප්‍රතිලාභ නිරූපනය වන ක්‍රමවත් පදනමක් මත (සරල මාර්ග) කල්බදු ආදායම හඳුනාගත යුතුය .**

8

JMC vLearning "your virtual learning partner"

# මූලය කල්බදු ගිණුම් තැබීම

පියවර 01 - වත්කමේ ධාරණ අගය ඉවත් කිරීම

පියවර 02 - කල්බද්දේ ශුද්ධ ආයෝජනය හඳුනා ගැනීම

පියවර 03 - වත්කමේ ධාරණ අගය සහ කල්බද්දේ ශුද්ධ ආයෝජනය අතර වෙනස විකුණුම් ලාභයක් ලෙස සැළකීම

පියවර 04 - කාලය ගතවීමත් සමඟ පොලී ආදායම හඳුනා ගැනීම

9

9

# මොකද්ද කල්බද්දේ ශුද්ධ ආයෝජනය කියන්නේ?

10

JMC vLearning
"your virtual learning partner"

## කල්බද්දේ දළ ආයෝජනය කල්බද්දේ ව්‍යංග පොලී අනුපාතයෙන් වට්ටම් කරාට පස්සේ ලැබෙන වටිනාකම

| කල්බද්දේ දළ ආයෝජනය | (නොඉපයූ මූල්‍ය ආදායම) | කල්බද්දේ ශුද්ධ ආයෝජනය |
|---|---|---|
| ලැබෙන්න තියෙන මුළු කල්බදු ලැබීම | කල්බද්දේ ව්‍යංග පොලී අනුපාතයෙන් ගණනය කළ පොලී ආදායම | ලැබෙන්න තියෙන මුළු කල්බදු ලැබීමේ වර්තමාන අගය |

11

11

## කල්බද්දේ දළ ආයෝජනය කියලා කියන්නේ

| | |
|---|---|
| මූලික තැන්පතුව | කල්බදු ගිවිසුමට එළඹෙද්දීම ගෙවන්න ඕනෙ ගණන |
| කල්බදු වාරික | ගෙවීමට නියමිත කල්බදු වාරික |
| සහතික කළ අවශේෂ වටිනාකම | කල්බදු කාලය අවසානයේ වත්කමේ වටිනාකම පිළිබඳ වෙනත් පාර්ශවයක් කල්බදු දීමනාකරුට වන සහතික වීම |
| සහතික නොකළ අවශේෂ වටිනාකම | කල්බදු කාලය අවසානයේ උපලබ්ධි විය හැකි වටිනාකම පිළිබඳ සහතික නොකළ අගය |

12

12

JMC vLearning "your virtual learning partner"

## උදාහරණ

කල්බදු කාලයට අවසානයේ වත්කමේ අවශේෂ වටිනාකම රු. 50,000 ක් යැයි කල්බදු දීමනාකරු අපේක්ෂා කරයි. අවශේෂ අගයෙන් රු. 30,000 ක් සඳහා ඇපකරයක් කල්බදු දීමනාකරු සපයයි. එසේනම් සහතික කල අවශේෂ වටිනාකම රු. 30,000 ක් වන අතර සහතික නොකල අවශේෂ වටිනාකම රු. 20,000 ක් වේ.

13

13

## ද්විත්ව සටහන්

කල්බද්දේ ශුද්ධ ආයෝජනය හඳුනා ගැනීම

කල්බද්දේ ශුද්ධ ආයෝජනය හර
වත්කම් ගිණුම බැර
ලාභාලාභ ගිණුම හර/බැර

පොලී ආදායම (කල්බදු වගුව තුලින් ගණනය කෙරේ)

කල්බද්දේ ශුද්ධ ආයෝජනය හර
පොලී අදායම බැර

14

14

# ද්විත්ව සටහන්

කල්බදු වාරික ගෙවීම

මුදල් හර
කල්බද්දේ ශුද්ධ ආයෝජනය බැර

# ඉදිරිපත් කිරීම

කල්බද්දේ ශුද්ධ ආයෝජනයේ ඊළඟ වාරිකය තුල ඇතුලත් ප්‍රාග්ධන කොටස ජංගම වත්කමක් ලෙසත් ඉතිරිය ජංගම නොවන ලෙසත් හඳුනාගත යුතුය.

15

15

කල්බදු සඳහා ගිණුම් තැබීමේදී අපට කල්බදු ක්‍රමක්ෂය වගුවක් වුවමනා වේ පහත දැක්වෙන්නේ එම වගුවේ ආකෘතියයි

| වර්ෂය | ආරම්භක ශුද්ධ ආයෝජනය | පොළිය | කල්බදු ලැබීම් | ප්‍රාග්ධන නැවත ලැබීම් | අවසාන ශුද්ධ ආයෝජනය |
|---|---|---|---|---|---|
| A | B | C = B x r% | D | E = D – C | F = B - E |
| | | | | | |

16

JMC vLearning
"your virtual learning partner"

## ප්‍රශ්න 01

ජානක සමාගම සිය යන්ත්‍රයක් වර්ෂ 05 ක කාලයක් සඳහා කල්බද්දට ලබාදෙන ලදි. ගිවිසුම යටත් ජානකට සෑම වසරක් අවසානයේ§ම රු. 25,000 ක් ලැබේ. යන්ත්‍රයේ අවශේෂ වටිනාකම රු. 20,000 ක් යැයි අපේක්ෂා කරයි. ජානක විසින් අවශේෂ වටිනාකම සඳහා රු. 12,000 ක් ඇපකරයක් ලබා දී ඇත. කල්බද්දේ ව්‍යංග පොලී අනුපාතය 12.542% කි. උපකරණවල ධාරණ අගය රු. 50,000 ක

17

17

## ප්‍රශ්න 01

1. කල්බද්දේ දළ ආයෝජනය ගණනය කරන්න.
2. කල්බද්දේ ශුද්ධ ආයෝජනය ගණනය කරන්න. (කල්බදු වගුව තුලින්)
3. නොඉපයූ මූල්‍ය ආදායම ගණනය කරන්න.
4. විකුණුම් ලාභය හෝ අලාභය ගණනය කරන්න.
5. පළමු වසරේ ද්විත්ව සටහන් T ගිණුම තුලින් දක්වන්න.
6. පළමු වර්ෂය අවසානයේ මූල්‍ය ප්‍රකාශ උද්ධෘතයන් දක්වන්න.

18

18

# පිළිතුරු 01



19

JMC vLearning
"your virtual learning partner"

# පිළිතුරු 01



20

## පිළිතුරු 01

ˆබාැචී ඡ්හීැනැරී - නඑක

21

21

## ප්‍රශ්න 02

සසිඳු සමාගම තම වෑන් රථයට කල්බදු පහසුකමක් යටතේ වසර 5 ක කාලයක් සඳහා ලබා දී ඇත. වාහනයේ ඵලදායී ජීව කාලය ද වසර 5 ක් වූ අතර ධාරණ අගය රු. මිලියන 5 ක් විය. කල්බද්දේ ව්‍යාංග පොලී අනුපාතය 10% ක් විය. සෑම වසරකම අගදී වාරික ගෙවනු ලැබේ.
අවශේෂ වටිනාකමක් නැතැයි උපකල්පනය කරන්න. වත්කමේ සාධාරණ අගය රු. මිලියන 6 ක් වේ.

22

22

JMC vLearning
your virtual learning partner"

## ප්‍රශ්න 02

1. මෙය මූල්‍ය කල්බද්දක් ද මෙහෙයුම් කල්බද්දක් ද යන්න සඳහන් කරන්න.
2. කල්බදු වාරිකයක වටිනාකම ගණනය කරන්න.
3. කල්බදු වගුව පිළියෙල කරන්න.
4. වත්කම් විකුණුම් ලාභය / අලාභය ගණනය කරන්න.
5. T ගිණුම් තුලින් පළමු වර්ෂයේ ගිණුම දක්වන්න.
6. පළමු වසර සඳහා මූල්‍ය ප්‍රකාශ උද්ධෘතයන් දක්වන්න.

23

23

JMC vLearning
“your virtual learning partner”

## පිළිතුරු 02

"බාැච් ඡ්හීැනැර් - නච්ක

24

24

# පිළිතුරු 02



25

# පිළිතුරු 02



26